# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2020.06.16

වර්ෂ 2020 ක් වූ ජුනි මස 16 වැනි අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ ජුනි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රිනී ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
10. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
11. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
12. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
13. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
14. ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
15. ගරු මන්ත්‍රිනී ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
16. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
17. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි.**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රිනී ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
05. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච් අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම :-</u>**

**<u>01. 2020-05-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** 2020-05-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදිකිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020-05-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා :-** 2020-05-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

(ගරු මන්ත්‍රිනී ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** 11 පිටුව

''රතුලූණු '' ඒක '' රට ලූණු '' ලෙස සංශෝධනය විය යුතුයි.

61 පිටුව

'' ඒකට ගන්න ඕන නැත්නම් අවසරයක් '' ඒක '' ඒකට පරිසර අධිකාරියෙන් ගන්න ඕන නැත්නම් අවසරයක් '' ලෙස සංශෝධනය විය යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** 2020-05-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඇත්තටම අද දිනයේ අපේ මාධ්‍යවේදී මහත්වරුන්ට යම් අපහසුතාවයක් වෙනවා නම් ඒ පිළිබඳව මම මගේ කණගාටුව ප්‍රකාශ කරනවා. නිරෝධායන නීතිය අනුව දුරස්ථභාවය තියාගෙන තමයි මහා සභා රැස්වීම පවත්වන්න සිද්ධවෙන්නේ. ඉතින් ඒක හින්දා ලබන සභාවේ සිට සුපුරුදු පරිදි අපි බලාපොරොත්තු වෙනවා මහා සභා රැස්වීම පැවැත්වීමට. ඊළඟට මම සියලු මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන් ඉල්ලා සිටිනවා, ඇත්තටම මට විශාල චෝදනාවක් තියෙනවා මන්ත්‍රීවරුන්ගෙන් කීප දෙනෙක්ට විතරයි අවස්ථාව ලබා දෙන්නේ කියලා. ගිය මහා සභා රැස්වීමේදී අපේ සියලුම මන්ත්‍රීවරු සභා ගර්භයෙන් නැගිටලා ගියා මේකෙදි කීපදෙනෙකුට විතරක් අවස්ථාව ලබාදෙනවා කියලා. අද ඉඳන් න්‍යායපත්‍රානුකූලව කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. න්‍යායපත්‍රයේ තියෙන කාරණාවක් සම්බන්ධයෙන් විතරයි කතා කරන්න පුළුවන්. ඊළඟට ඒකත් ඒ අදාළ කාරණාව මතුවෙච්ච අවස්ථාවේදී විතරයි. ඒකට අඩුපාඩු තියෙනවා නම් ප්‍රගතිය වෙලාවේදී සාකච්ඡා කරන්න පුළුවන්. ඔබතුමන්ලාට ගාල්ල දිස්ත්‍රික්කයේ ඕන සභාවක් බලන්න පුළුවන්. ගිහිල්ලා කතා කරන්න පුළුවන්. පෙ.ව 11.30, පෙ.ව 12.00 වෙනකොට මහා සභා රැස්වීම ඉවර වෙනවා. එදා මට අක්මීමන සභාපතිතුමා හදිසි කාරණාවකට කීපවාරයක් දුරකථන ඇමතුම් අරගෙන තිබුණා. එවලේ මට දුරකථනයට සවන් දෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ සභාවේ රැස්වීම ඒ වෙනකොටත් ඉවරයි. ඇත්තටම ගොඩක් වෙලාවට සභාව අනවශ්‍ය තැනකට යනවා කියලා මටත් තේරෙනවා. මම නවක මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබා දෙන්න ඕන. ඒක නිසා මම සියලුම මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන් ඉල්ලා සිටිනවා න්‍යායපත්‍රානුකූලව අදාළ අවස්ථාවේදී පමණක් ඒ පිළිබඳව අදහස් දක්වන්න. සමහර වෙලාවට ප්‍රගතියේදී කතා කරන්න ඕන ඒවත් මැද්දි කතා කරලා ලොකු ආරවුලකට යන වෙලාවල් තියෙනවා. ඉතින් ඒකෙදි අද න්‍යායපත්‍රානුකූලව යමු කියලා ප්‍රකාශ කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, ඔබතුමා කියපු දේ නිවරදියි. සභාව ඉක්මනට ඉවර කරන්න ඕන. හැබැයි ඒ සඳහා ඔබතුමාම බාධකයක් වෙනවා සමහර වෙලාවට කතා කරන්න නොදීම නිසා. ඒක ගැනත් හිතන්න. අපිට කතා කරන්න ඉඩ දීලා කතා කරන්න. ඊළඟට මම හිතනවා අපි ඕන වෙලාවක් ඉන්න සූදානම්. මේ සභාවේ එහෙම ගෞරවයක් තිබුණා. අපි අද නවක මන්ත්‍රීවරුන්ට ඕන තරම් කතා කරන්න දෙන්න සූදානම්. අපි අහගෙන ඉන්නම්. ඊට පස්සේ අපි කතා කරන්නම්. ඔබතුමන්ලා අපි කොයිතරම් හිටියද රෑ වෙනකම්. මේ සභාවෙන් ගියේ නැහැ හදිසි වුවමනාවකට ඇරෙන්න. අපි ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** නෑ. නෑ. කතා කිරීම පිළිබඳ ප්‍රශ්නයක් මේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ගරු සභාපතිතුමනි,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** නෑ. නෑ. වෙලාව දෙන්න බැහැ. ඔබතුමාට වෙලාව දෙන්න විදියක් නැහැ. ඇයි දෙන්නේ, මොකක්ද හේතුව.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** න්‍යායපත්‍රය සම්බන්ධව මට කාරණයක් ඉදිරිපත් කරන්න තියෙනවා. මම යෝජනා හතරක් ඉදිරිපත් කරලා තිබුණා. ඔබතුමා යෝජනා දෙකයි න්‍යායපත්‍රයට දාලා තිබුණේ. මට ඒක දැනගන්න අවශ්‍යයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමා දන්නවද දන්නේ නැහැ. මට තියෙනවා බලයක් සභාවට අවශ්‍ය දේවල් පමණක් ඉදිරිපත්කිරීමේ න්‍යාය පත්‍රය සකස්කිරීමේදී. ඒක ඔබතුමා දන්නවාද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** සභිකයන් ඉදිරිපත් කරන යෝජනා සභාවේ විෂය පථයට අයත් නොවන්නේ නම් ඒ සම්බන්ධව තීන්දුවක් අරගෙන අදාළ මන්ත්‍රීවරයාව දැනුවත් කරන්න පුළුවන්. ඕන එක අයින් කරන්නයි, ඕන එක දාගන්නයි බලයක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ''රාජ්‍ය වතුයායක් වන සිට්ට්‍රස් වතුයාය මේ වන විට පෞද්ගලික වතු සමාගමක කළමනාකාරීත්වය යටතේ ක්‍රියාත්මක වේ. මේ යටතේ පසුගිය කාලය තුළ මෙකී වතුවල කටුපොල් වගාව සීඝ්‍ර ලෙස ව්‍යාප්ත විය. එකී වගාව වතු ආශ්‍රිත කම්කරු ජනතාවන්ගේ රැකියාවට හා ආර්ථිකයට අහිතකර වශයෙන් බලපා ඇති අතර පාරිසරික වශයෙන් ද හිතකර නොවේ.

එබැවින් එකී ප්‍රති සමාගම් සතුව පවතින මුඩු බිම් හා නැවත වගා කරනු ලබන බිම් සඳහා අප රටේ ප්‍රධාන ආර්ථික බෝගයක් මෙන්ම අතුරු බෝග වගාවන්ට හා වන වගාවට ද සුදුසු පරිසර හිතකාමී ආර්ථික බෝගයක් වන රබර් වගාව සඳහා නිර්දේශ කර වතු සමාගම් සතු සුදුසු ඉඩම්වල රබර් වගාව සඳහා යොමු කිරීමට කටයුතු කරන මෙන් වැවිලි කර්මාන්ත ගරු අමාත්‍ය රමේෂ් පතිරණ මහතා වෙත දන්වා යැවීමට කටයුතු කරන මෙන් මෙම ගරු සභාවට යෝජනා කරමි.''

රමේෂ් පතිරණ ඇමතිතුමාට මේක දැනුම් දීලා තියෙන්නේ. ඒක සභාව මට්ටමින් දැනුවත් කරන්න ඕන නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** කවුද දැනුවත් කරලා තියෙන්නේ. ඒක ඔබතුමා වෙනම ගිහිල්ලා දැනුවත් කරලා තියෙන නිසා මේකට දාන්න ඕන නැහැ කියලා තීන්දු ගන්න බැහැ ඔබතුමාට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මේක දැනට ක්‍රියාත්මක වෙන එකක්. මන්ත්‍රීතුමා ඔබතුමා දන්නවාද දන්නේ නැහැ. මේක දැනටමත් ගාල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** මොකක්ද ක්‍රියාත්මක වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මේ කටුපොල් වගාව නවත්වලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** කටුපොල් වගාව නවත්වපු එකක් නෙමෙයි. ඒ යෝජනාවේ තියෙන්නේ වන වගාවක් හැටියටත්, ආර්ථික බෝගයක් හැටියටත් රබර් වගාවට ඉඩකඩ සලසන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමා දන්නවද දන්නේ නැහැ. ''දැන්වීමක් කරනු ලබන සෑම යෝජනාවක්ම, ප්‍රාදේශීය සභාවේ කටයුතු පරිපාලනය කෙරෙහි බලපාන යම් ප්‍රශ්නයකට අදාළ විය යුතුය.'' මොකක්ද මේකේ සභාවට තියෙන අදාළකම.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** අප බල ප්‍රදේශයේ ජීවත්වෙන, වැඩ කරන ජනතාවට තියෙන ප්‍රශ්නයක් මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මේක ජාතික මට්ටමේ ප්‍රශ්නයක්. ඔබතුමාට මේක පාර්ලිමේන්තුවේ කතා කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඔබතුමාගේ දැනුම සම්බන්ධව ප්‍රශ්නයක් මට තියෙනවා. මම පාර්ලිමේන්තුවේ කතා කරන්න නෙමෙයි යෝජනා කරන්නේ. මෙතන තීන්දු තීරණ අරගෙන

රබර් වවන්න නෙමෙයි යෝජනා කරන්නේ. යෝජනා කරන්නේ අදාළ විෂයභාර ඇමතිතුමාව මේ සම්බන්ධව දැනුවත් කිරීම සඳහා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** දැනුවත් කරලා තියෙන්නේ. අපි දැනුවත් කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** කවුද දැනුවත් කරලා තියෙන්නේ. මේ සභාවේ දැනුවත් කරලා තියෙනවද. ඒ අදාළ භූමියේ හැටියට වඩා සුදුසු වන්නේ කටුපොල් නෙමෙයි රබර් වගාව. එවැනි වන වගාවක් ඇති කරන්න යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඊළඟ කාරණාව '' පසුගිය කාලය තුළදී ලෝක වෙළඳපොලේ බොරතෙල් මිල වෙනස්වීමට සාපේක්ෂව මෙරට ඉන්ධන මිල උච්චාවචනය වීම සිදු වූ නමුත් මේ වනවිට ලෝක වෙළඳපොලේ බොරතෙල් මිල ශීඝ්‍ර ලෙස පහළ යාමේ වාසිය මෙරට ජනතාවට ලැබී නොමැත.

කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් රට තුළ පැවති නිරෝධායන ඇඳිරි නීතිය හා සමාජ දුරස්ථභාවය හේතුවෙන් රටේ සමස්ත ආර්ථිකය බිඳ වැටීමට ලක්ව ඇති අතර වර්තමානයේ දී අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු සේවා ගාස්තු මිල ඉහළ යාම හේතුවෙන් සමස්ත ජන ජීවිතවලට දැඩි බලපෑම් එල්ල වී ඇත.

මෙකී තත්වය සැලකිල්ලට ගනිමින් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව ඇතුළු මෙරට සමස්ත ජනතාවට සහන සැලසීම උදෙසා මෙරට තුළ සමස්ත නිෂ්පාදන හා සේවා වල පිරිවැය සඳහා ඍජුව බලපාන ඉන්ධන මිල, ලෝක වෙළඳපොලේ බොරතෙල් මිල අඩුවීමට සමගාමීව පහත හෙළන මෙන් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත කඩිනමින් දන්වා යැවීමට කටයුතු කරන මෙන් මෙම ගරු සභාව රජයට යෝජනා කර සිටී.''

(ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඊළඟ කාරණාවට කලින් අර කාරණාව තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මම කාරණා දෙක කියලා ඉන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** එකින් එක විග්‍රහ කරමු. දෙක පටලවා ගන්න එපා. ඔබතුමා හැමදාම කරන්නේ ඔය වැඩේනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** හැමදාම නෙමෙයි. මේක සභාවට අදාළ කාරණයක් නෙමෙයි. ඒකයි අයින් කරේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** සභාවට අදාළ නැති කාරණයක් කියලා කොහොමද තීන්දු කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මම තීන්දු කරේ සභාවට අදාළ නැති කාරණාවක් කියන එක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඔබතුමාට ඕන ඕන විදියට තීන්දු ගන්න බැහැ. ඔබතුමාට තීන්දු තීරණ ගැනීමේ බලතල පනතෙන් දීලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමා ඉඳගන්න කරුණාකරලා. මේක සභාවට අදාළ කාරණයක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** මගේ යෝජනාව ඔබතුමා තේරුම්ගන්න එපැයි ඉස්සෙල්ලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** තේරුම් අරගෙන ඉන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඔබතුමා ඒ යෝජනාව තේරුම් අරගෙන ඒකට ප්‍රතිචාර දක්වන්න ඕන එහෙම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මම මන්ත්‍රීතුමා වගකීමෙන් මෙතන ප්‍රකාශ කරනවා මේක දැනට ක්‍රියාත්මක වෙනවා. වැවිලි කර්මාන්ත අමාත්‍යංශයේ මේක දැනට ක්‍රියාත්මක වෙනවා. මම වගකීමෙන් කියනවා සභාපතිතුමා විදියට. ඒකෙදි මේක නැවත දන්වලා යැවීම සභාවේ සභාපති හැටියට විහිළුවක්. මේක විහිළුවක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** එකේ මම කියන්නේ කටුපොල් තහනම් කරන්න කියලා නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** කටුපොල් තහනම් කරලා වෙනත් වගාවක් ඇති කරන්න. ඉතින් ඒක ක්‍රියාත්මක වෙනවා දැන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ආයේ කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ආයේ කියනවා කියන්නේ මොකක්ද. රමේෂ් පතිරණ ඇමතිවරයා අපේ සංවිධායකවරයා. ඒකෙදි ඔබතුමා බාහිරයේ ඉඳන් ඒක දන්නේ නැතුව ඇති ඒකයි. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා මම. ඔය කාරණා දෙකම අනුව මම දන්නවා. මගේ අත්සනින් නැවත එතුමට ලියුමක් යවන්න බැහැ. එතුමා දන්නවා, අපි මේක සාකච්ඡා කරලා තීන්දු ගත්තා. චනක මන්ත්‍රීතුමා දිගින් දිගට කතා කරා මේ ප්‍රශ්නය පිළිබඳව.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** මමත් කතා කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** චනක මන්ත්‍රීතුමා දිගින් දිගට කතා කරපු නිසා මේක දන්නවා. ඔබතුමා මේක කියන්න දෙයක් නැහැ. මේකට සභාවෙන් යවන්න දෙයක් නැහැ. ඒකට උත්තරය එච්චරයි.

'' පසුගිය කාලය තුළදී ලෝක වෙළඳපොලේ බොරතෙල් මිල වෙනස්වීමට සාපෙක්ෂව මෙරට ඉන්ධන මිල උච්චාවචනය වීම සිදු වූ නමුත් මේ වනවිට ලෝක වෙළඳපොලේ බොරතෙල් මිල ශීඝ්‍ර ලෙස පහළ යාමේ වාසිය මෙරට ජනතාවට ලැබී නොමැත.

කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් රට තුළ පැවති නිරෝධායන ඇඳිරි නීතිය හා සමාජ දුරස්ථභාවය හේතුවෙන් රටේ සමස්ත ආර්ථිකය බිඳ වැටීමට ලක්ව ඇති අතර වර්තමානයේ දී අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු සේවා ගාස්තු මිල ඉහළ යාම හේතුවෙන් සමස්ත ජන ජීවිතවලට දැඩි බලපෑම් එල්ල වී ඇත.

මෙකී තත්වය සැලකිල්ලට ගනිමින් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව ඇතුළු මෙරට සමස්ත ජනතාවට සහන සැලසීම උදෙසා මෙරට තුළ සමස්ත නිෂ්පාදන හා සේවාවල පිරිවැය සඳහා සෘජුව බලපාන ඉන්ධන මිල, ලෝක වෙළඳපොලේ බොරතෙල් මිල අඩුවීමට සමගාමීව පහත හෙළන මෙන් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත කඩිනමින් දන්වා යැවීමට කටයුතු කරන මෙන් මෙම ගරු සභාව රජයට යෝජනා කර සිටී.''

මේක මෙතන කතා කරන්න ඕන ප්‍රශ්නයක් නෙමෙයි. ඒක මන්ත්‍රීතුමා බන්දුල ගුණවර්ධන ඇමතිතුමා දිගටම කියන කාරණයක්. මේ වෙලාවේ බොරතෙල් බැරල් එකේ මිලට වැඩිය රටේ ආදායම් මුකුත්ම නැහැ. රටේ ආදායම් සියලු දේ ඇහිරිලා තියෙන්නේ. ජනතාවට රු.5,000.00 දීමනාව දුන්නා. ඒ වගේම රට ස්ථාවරව පවත්වාගෙන යනවා. අනිත් සියලු පහසුකම් ලබා දුන්නා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** බොරු කියන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** බොරු නෙමෙයි. මේක මෙතනට අවශ්‍ය කාරණයක් නෙමෙයි. සභාවෙන් තීන්දුවක් ගන්න බැරි කාරණයක්. සභාවේ විෂය පථයට අදාළ කාරණයක් නෙමෙයි. මේක ඔබතුමාගේ දේශපාලන විග්‍රහයට අදාළ ඇති. නමුත් මේක සභාවේ විෂය පථයට ආදාළ නැහැ. එහෙම දේවල් දාන්නේ නැහැ මන්ත්‍රීතුමා. අනිත් දවසේ දාන්නේ නැහැ. ඔබතුමාට පුළුවන් දෙයක් කරන්න. අනිත් දවසේ විෂය පථයට අදාළ නොවන දේවල් දාන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** එහෙම කරන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** රජයෙන් මේවාට ප්‍රකාශ කරලා තියෙනවා. රජයෙන් ප්‍රකාශ කරලා තියෙද්දි මම සභාපතිවරයා විදියට මේවා ලිඛිතව අදාළ තැන්වලට යවන එක

විහිළුවක්. ඔබතුමාලා ඒක ඔබතුමාලාගේ දේශපාලන ක්‍රියාමාර්ග එක්ක ඕන දෙයක් කරන්න. මේක විෂය පථයට අදාළ නැහැ. ඔය හේතු නිසා තමයි ඔය යෝජනා දෙක අයින් කරේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මෙන්න මේ මන්ත්‍රීවරු දෙන්නා තමයි හැමදාම මේක අවුල් කරන්නේ. මේ පහළ මන්ත්‍රීවරු චෝදනා කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඔබතුමාගේ කටින්ම ගිය සභා වාරයේදී කිවුවා අපි මැදිහත්වීම හොඳයි කියලා. යෝජනා හොඳයි කියලා කිවුවා. දැන් කියනවා කඩාකප්පල් කරනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔව්. දැන් පෙන්නේ නැද්ද. දැන් මම උදේම මේක පටන් ගනිද්දිම කිවුවා කරුණාකරලා න්‍යායපත්‍රය අනුව කරන්න දෙන්න කියලා. ඔබතුමාලා ලෝක වෙළඳපොලේ ඒවා, රජය සම්බන්ධ දේවල් දාලා මම මෙතන සභාව කරලා විහිළුවට ලක් වෙන්නද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඔබතුමා විහිළුවට ලක්වෙනවා තේරුම් ගන්න බැරි නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ජනතාවට බොරතෙල් බැරල් එකේ මිල අඩුවීමේ වාසිය සභාවට දෙන්න පුළුවන්ද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඒක බල ප්‍රදේශයේ ජනතාවට බලපාලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මෙහෙමයි. මේක කඩාකප්පල් කරනවද, සභාව කරගෙන යන්න දෙනවද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඔබතුමා කඩාකප්පල් කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමා වාඩිවෙන්න කරුණාකරලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** මේක කාගෙත් ප්‍රශ්නයක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** මේක පොදු ප්‍රශ්නයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මේක ඔබතුමාගේ ප්‍රශ්නයක් වෙන්නේ කෙහොමද.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මෙතෙක් කල් ඇහුම්කන් දුන්නා. මේ සභාවේ අනවශ්‍ය දේවල් තමයි බහුතරයක් කතා කරේ. ඒක හින්දා මම වගකීමෙන් සභාපතිවරයා විදියට මගේ කාර්යභාරය ඉෂ්ට කරනවා. අදාළ නැති දේවල් දාලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඒ කියන්නේ මෙච්චර කල් ඉෂ්ඨ වුණේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඉෂ්ට වුණේ නැහැ. මම පිළිගත්තා ඒක. සභාවේ අනවශ්‍ය දේවල් කතා කරලා, සභාවට අනවශ්‍ය දේවල් දාලා ඒක ඉෂ්ට වුණේ නැහැ කියලා මම පිළිගන්නවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** අනවශ්‍ය දේවල් දැම්මේ කවුද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමාලානේ දැම්මේ. මෙතෙක් කල් දාන්න දුන්නනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** අනවශ්‍ය දේවල් දාන්නේ අපි විතරද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** සභාවේ විෂය පථයට අදාළ නොවන දේවල් දාන්න දෙන්නේ නැහැ. හැමදාම සභාවක් කරන්න දෙන්නේ නැහැ. ඔබතුමන්ලාගේ

ප්‍රජාතන්ත්‍රවාදීකම අපි දන්නවානේ. ඔබතුමා වාඩිවෙන්න කරුණාකරලා. මේක ඔබතුමාට අදාළ කාරණයක් නෙමෙයිනේ.

(ගරු මන්ත්‍රිනී ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** අදහසක් දක්වන්න ඕන.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මේ අයට සභාව කරන්න ඕන නැහැ. මම සභාව කල් තියනවා. මම සභාව කල් තියලා යනවා. ඒකනේ ඕන. හැමදාම මේ අබේසේකර මන්ත්‍රීවරයයි, ඉන්දික විජයවික්‍රම මන්ත්‍රීවරයයි මේක කඩාකප්පල් කරනවා. මම පටන් ගනිද්දිම ඕක කිවුවනේ. එක මතයයි තියෙන්නේ. සභාවේ විෂය පථයට අදාළ නොවන දේවල් න්‍යායපත්‍රයට දාන්න බැහැ. අදාළ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** බල ප්‍රදේශයේ ජනතාවට වගකියන්නේ සභාපතිවරයා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මේ මැතිවරණයක් තියෙන වෙලාවේ අනවශ්‍ය දේශපාලන වාසි ගන්න ඉදිරිපත් කරපුවා මේවා. බංකොලොත් දේශපාලනය.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මම නම් කරලා මන්ත්‍රීවරු දෙන්නව එළියට දානවා. කරුණාකරලා වාඩිවෙන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** එහෙම දාන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** නම් කරලා ඇදලා දානවා දෙන්නවම. නම් කරලා ඇදලා දාන්න කලින් වාඩිවෙන්න දෙන්නම. කරුණාකරලා වාඩිවෙන්න. ප්‍රේමලාල් අබේසේකර මන්ත්‍රීවරයයි, ඉන්දික විජයවික්‍රම මන්ත්‍රීවරයයි කරුණාකරලා සභා ගර්භයෙන් එළියට දාන්න ඕන. කරුණාකරලා මේ මන්ත්‍රීවරු දෙන්නව එළියට දාන්න. සභාව කඩාකප්පල් කරනවා. මම පොලීසියට පැමිණිලි කරනවා.

රීති අංක 26, විනය විරෝධී හැසිරීම. රීති අංක 26 අනුව මේ දෙන්නව එළියට දාන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** රීති විරෝධී තමුන්නාන්සේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** කරුණාකරලා එළියට බහින්න දෙන්නම. මේකේ සභාවක් කරන්න දෙන්නේ නැහැ කඩාකප්පල් කරනවා. මාසයකට දවසයි සභාව තියෙන්නේ. හැමදාම මේක කඩාකප්පල් කරන්න හදන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** අපි ජනතාව වෙනුවෙන් දාපු යෝජනාවක් න්‍යායපත්‍රයට දාගන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ගරු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම මාධ්‍යවේදී මහත්වරුනි, අබේසේකර මන්ත්‍රීවරයයි, ඉන්දික මන්ත්‍රීවරයයි හැමදාම සභාව කඩාකප්පල් කරනවා. මේක මාධ්‍යයට යන්න ඕන. මාසයකට දවසයි සභාව පැවැත්වෙන්නේ. අද සභාවත් කරගෙන යන්න දෙන්නේ නැහැ. මම සභාව ලබන අඟහරුවාදාට කල් තියනවා. ලබන අඟහරුවාදා උදේ 09.30ට මේ ස්ථානයේදී සභාව පැවැත්වෙනවා. අද මේ සභා රැස්වීම අඩාලව කල් තියනවා.

**(සභාව ලබන අඟහරුවාදා පෙ.ව 09.30 තෙක් අඩාලව කල් තබන ලදී.)**

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.